" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/09-34/FI/01-01 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2021.03.01 |

පාලන චක්‍රලේඛ : 02/2021

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය.

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් (බ.ප).

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / පිරිස් හා පුහුණු / මූල්‍ය /සැලසුම් / ඉංජිනේරු).

ආදායම් කොමසාරිස්, ආදායම් දෙපාර්තමේන්තුව (බ.ප).

ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප)

ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප).

ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම් / පරිපාලන නිලධාරි.

<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධවයි.</u>

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ මූලික විමර්ශන පැවැත්වීම, චෝදනා පත්‍ර නිකුත් කිරීම, විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම, විනය නියෝග නිකුත් කිරීම, අභියාචන සම්බන්ධ ක්‍රියාවලිය ප්‍රමාද වීම හේතුවෙන් විනය කටයුතු වලට භාජනය වන නිලධාරීන් අපහසුතාවයට පත්වන බව ගරු ආණ්ඩුකාරතුමන් වෙත හා මා වෙත පැමිණිලි ලැබී ඇති අතර නිසි විනය බලධාරීත්වයක් නොමැතිව විනය ක්‍රියාමාර්ගයන් ගෙන ඇති අවස්ථාවන් පවතින බවත් නිරීක්ෂණය වී ඇත.

02. එබැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.03.26 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 2064/8 , 2018.07.31 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 2082/7 හා 2019.06.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2127/29 මගින් පවරා ඇති බලතල ප්‍රකාරව නිසි විනය බලධාරීත්වය හඳුනා ගෙන විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. එමෙන්ම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වන වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ විනය කාර්යය පරිපාටිය නිශ්චිත කිරීම සඳහා බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් ප්‍රකාශයට පත් කරන ලදුව එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2203/27 හා 2020.11.26 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර එම රීති 2020.12.15 වන දින සිට ක්‍රියාත්මක වේ.

එබැවින් එම දිනයෙන් පසුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අදාල වන්නේ එම විනය රීතීන් වන බැවින් ඒ අනුව කටයුතු කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

04. මූලික විමර්ශන සිදු කිරීම සම්බන්ධ ගෙවීම් කටයුතු 2014.05.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2014 අනුව සිදු කරන ලෙසත් විධිමත් විනය පරීක්ෂණ සඳහා ගෙවීම් කටයුතු 2018.07.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2018 අනුව ගෙවීම් සිදු කරන ලෙසත් දන්වමි.

05. ඉහත උපදෙස් පිළිබඳව ඔබ කාර්යාලයේ නිලධාරීන් මෙන්ම ඔබ යටතේ පවතින දෙපාර්තමේන්තු/ආයතන/කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.